# විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ
# කළමනාකරණ සහකාර අධිපන්තිය සඳහා වන
# බඳවා ගැනීමේ පටිපාටිය

**01.** සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : අදාල නොවේ

1.2 අමාත්‍යාංශය:විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යොමු අංකය : TR/2/11/STO/F.R /71 දිනය : 2017.12.14

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම යොමු අංකය : DMS/0019 දිනය : 2014.11.14

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය: යොමු අංකය : EST-2/04/REC/8034 දිනය : 2016.12.30

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය : යොමු අංකය : NSCC/07/14/SR දිනය : 2016.10.31

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය : යොමු අංකය : PSC/EST/03-01-07/01/2017 දිනය : 2018.01.04

**02.** පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03.** සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය: කළමනාකරණ සහකාර අධිපන්තිය

3.2. ශ්‍රේණිය: විශේෂ ශ්‍රේණිය

3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය

අනුමත තනතුරු සංඛ්‍යාවට සීමාවන පරිදි අභ්‍යන්තර බඳවාගැනීමේ ක්‍රියාවලියක් මගින් බඳවාගනු ලබන, ජ්‍යෙෂ්ඨ විධායක හා විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට පරිපූරක / සුසාධ්‍යකාරක / උපස්ථම්භක වන පරිදි එම නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව තනතුරු විශේෂිත කොට පවරා දෙනු ලබන පරිපාලනමය / කළමනාකරණ සහ මූල්‍ය කළමනාකරණ කාර්යයන් පැවරෙන නිලධර ගණයකි.

3.4. කාර්යයන් පැවරීම: ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04.** තනතුරෙහි / තනතුරු වල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

( විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය.)

**05.** වැටුප්

5.1. වැටුප් කේත අංකය: MN 7 -2016

5.2. වැටුප් පරිමාණය :41,580 - 11 x 755 - 18 x 1,030– 68,425

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර:

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භ කවැටුප් තලය (රු) |
|---|---|---|
| විශේෂ | 05 | 44,600/- |

සටහන: වර්ෂ 2016 සිට 2020 දක්වා වැටුප් ගෙවීම හා සෙසු කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන වලට අනුකූල විය යුතුය.

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්:

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| දිස්ත්‍රික් විද්‍යාත්මක නිලධාරි | විශේෂ | 25 | • දිස්ත්‍රික්කය තුළ ඇති සියලුම විද්‍යා සම්පත් මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීම හා විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්ගේ රාජකාරී හා විද්‍යා මධ්‍යස්ථානවල සේවයේ නියුතු මානව සම්පත් කළමණාකරනය හා අධීක්ෂණය කිරීම.<br>• නවීන තාක්ෂණය භාවිතයෙන් ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සඳහා ව්‍යාපෘති හඳුනා ගැනීමට යෝජනා ඉදිරිපත් කිරීම හා සම්බන්ධීකරණය<br>• පවතින ව්‍යාපාර හා ස්වයං රැකියා වලට තාක්ෂණ ආධාර ලබාදීම සඳහා ආයතන අතර සම්බන්ධීකරණයටඋදවුදීම.<br>• තරුණ තරුණියන්ගේ උනන්දුව හා සහජ දක්ෂතාවයන් හඳුනා ගෙන ඒ සඳහා සුදුසු පුහුණු පාඨමාලා වෙත යොමුකිරීම.<br>• වෙළඳපොල පහසුකම් සපයාදීම සඳහා මඟපෙන්වීම.<br>• විද්‍යා තාක්ෂණ සංගම් පිහිටුවීම.<br>• තාක්ෂණය ගමට ගෙනයෑම කර්තව්‍ය සඳහා අවශ්‍ය වන්නා වූ රාජ්‍ය හා පෞද්ගලික ආයතන සමග මනා සම්බන්ධතාවක් පැවැත්වීම.<br>• පැරණි සම්ප්‍රදායික විද්‍යා හා තාක්ෂණික ක්‍රම පිළිබඳ තොරතුරු එක් රැස්කර ඒ පිළිබඳ ඊට අදාළව ක්‍රියා කරනු ලබන රජයේ ආයතන වෙත යොමු කිරීම.<br>• අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය ලේකම් මගින් දක්වනු ලබන සියළුම රාජකාරී කටයුතු වල නිරත වීම මෙන්ම, අදාළ වාර්තා වැඩසටහන් නියමිත දිනට පෙර ඉදිරි පත් කිරීම.<br>• ඉහත සඳහන් නොවූ එහෙත් රටේ විද්‍යා හා තාක්ෂණ සංවර්ධනයට දායක විය හැකි වෙනත් කටයුතු තිබේ නම් ඒ පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ හා අමාත්‍යාංශයේ අවධානය යොමු කර ඔවුන්ගේ උපදෙස් පරිදි අදාළ කටයුතු කිරීම |

6.2. ඒකාබද්ධනිලධරසංඛ්‍යාව: 25 කි.

07. බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන්:

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | 100% |
| කුසලතා | අදාළ නොවේ |

7.2. විවෘත බඳවා ගැනීම: අදාළ නොවේ

7.3. සීමිත බඳවා ගැනීම

7.3.1.බඳවා ගන්නා ශ්‍රේණිය: විශේෂ ශ්‍රේණිය

7.3.2. සුදුසුකම්:

7.3.2.1. අධ්‍යාපන සුදුසුකම් : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලබාගත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව/ගණිතය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

7.3.2.2. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ

7.3.2.3. පළපුරුද්ද : විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් වශයෙන් වසර 15 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

7.3.2.4. කායික සුදුසුකම් : සෑම අපේක්ෂිතයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.3.2.5. වෙනත් : (i) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විම.

(ii) උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය.

(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3. වයස : අදාළ නොවේ

7.3.4. බඳවා ගැනීමේ ක්‍රමය : සීමිත තරඟ විභාගයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

7:3:4:1 ලිඛිත විභාගය:

| ප්‍රශ්න පත්‍රය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, කළමනාකරණය හා කාර්යාල ක්‍රම | 100 | 40 |
| 2. නව තාක්ෂණික ක්‍රමවේදයන් හා තාක්ෂණ පැවරුම් ක්‍රියාවලිය | 100 | 40 |

(විෂය නිර්දේශය හා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා වන කාලය ඇමුණුම 01 මගින් දක්වා ඇත.)

7.3.4.1. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.3.4.2.සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබා දෙනු නොලැබේ.

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂාකර බැලීම

7.3.4.2.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා } : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.4.3. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය: අදාළ නොවේ

7.3.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : "රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කිරීම හෝ අභ්‍යන්තර නිවේදනයක් මඟින් සහ වෙබ් අඩවියේ පළ කිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ."

08. කාර්යක්ෂමතා කඩඉම් : අදාළ නොවේ

09. භාෂා ප්‍රවීණතාව : අදාළනොවේ

10. ශ්‍රේණි උසස් කිරීම් : අදාළ නොවේ

11. තනතුරු වලට පත් කිරීම : අදාළ නොවේ

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි : අදාල නොවේ

13. රාජ්‍ය සේවා කොමිෂන් සභාකාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ:

"සක්‍රීය සේවා කාලය"යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන්ද ඇතුළත් , නිලධාරියකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :අදාළ නොවේ

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට්පත්‍රයෙන් ප්‍රකාශිත කාර්යපරිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවාගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

| | |
|---|---|
| සකස් කළේ : අත්සන : ..................... | පරීක්ෂා කළේ : අත්සන :..................... |
| (විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා) | (විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා) |
| නම :- ..................... | නම :- ..................... |
| තනතුර :- ..................... | තනතුර :- ..................... |
| දිනය :- 21/02/2018 | දිනය :- 18-02-23 |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ..........................................................

තනතුර : ..........................................................

ඩී. නන්දනී සමරවික්‍රම
අතිරේක ලේකම් (පාලන හා මුදල්)
විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

දිනය : 2018/02/27 ..........................................................     නිලමුද්‍රාව : ..........................................................

---

යොමු අංකය :TR/2/STO/FR/71

විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ හි දිස්ත්‍රික් විද්‍යා නිලධාරී තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................................................

නම : ..........................................................

ලේකම්

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණඅමාත්‍යාංශය

දිනය : 27/12 ..........................................................     නිලමුද්‍රාව ..........

උදය ආර්. සෙනෙවිරත්න
ලේකම්
විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
3 මහල, සෙත්සිරිපාය - I අදියර
බත්තරමුල්ල.

---

විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර අධිපතිත්‍ය සඳහා වන ~~හි දිස්ත්‍රික් විද්‍යා නිලධාරී තනතුර සඳහා යෝජිත මෙම~~

බඳවා ගැනීමේ පරිපාටිය 2018.01.04 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..........................................................

නම : ඒ. කුලතුංග ..........................................................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක. 1200/9, රජමල්වත්ත

දිනය : 2018.04.23 ..........................................................     නිලමුද්‍රාව ..........................................................

ඇමුණුම: 01

**විභාග/ වෘත්තීය පරීක්ෂණ පිළිබඳ විස්තර**

01. විභාගයේ නම : විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ දිස්ත්‍රික් විද්‍යා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, කළමනාකරණය හා කාර්යාල ක්‍රම | පැය 02 | 100 | 40 |
| 2. නව තාක්ෂණික ක්‍රමවේදයන් හා තාක්ෂණ පැවරුම් ක්‍රියාවලිය | පැය 02 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්කිරීමේ බලධරයා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් .

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද යන වග : පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තීරණය කරනු ලැබේ.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, කළමනාකරණය හා කාර්යාල ක්‍රම | වාර්ෂික ඇස්තමේන්තු හා ගණන් දීමේ නිලධාරියෙකුගේ වගකීම, මුදල් පාලනය, මූල්‍ය වගකීම් පැවරීම, මුදල් භාර ගැනීම, ගිණුම්ගත කිරීම හා ප්‍රතිග්‍රහණය කිරීම, ගෙවීම්, රාජ්‍ය මුදල් භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්, සැපයුම් හා සේවාවන්, ප්‍රසම්පාදන කටයුතු, භාණ්ඩ සමීක්ෂණ, විගනන විමසුම්, රජයේ කාර්යාල වල භාවිතා වන ලෙජර්, ආදායම් හා වියදම් සාරාංශ, බැංකු සැසඳුම් හා මූල්‍ය පාලන පොත්පත්, රාජ්‍ය මුදල් භාවිතය පිළිබඳ මෙතෙක් නිකුත් කර ඇති චක්‍රලේඛ හා රෙගුලාසි පිළිබඳ සාමාන්‍ය අවබෝධය පරීක්ෂා කෙරේ. |
| 02. නව තාක්ෂණික ක්‍රමවේදයන් හා තාක්ෂණ පැවරුම් ක්‍රියාවලිය | තාක්ෂණ පැවරුම් ක්‍රියාවලියේ මූලික සංකල්ප හා අවශ්‍යතාවයන්, අමාත්‍යාංශය යටතේ ඇති පර්යේෂණ ආයතනවල නව තාක්ෂණ සොයාගැනීම් හා දියුණු කිරීම්, අමාත්‍යාංශය යටතේ ඇති ආයතන පිහිටුවීමේ අරමුණු හා කාර්යයන්, දැනට ලංකාවේ විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන ප්‍රතිපත්තිය, රටක සංවර්ධනය මනිනු ලබන සාර්ව ආර්ථික දර්ශක, තාක්ෂණ පැවරීමේ ක්‍රියාවලියේ මුහුණදෙන ගැටළු හා බාධක. |

එන්.සී.ජේ. දිනූෂිකා
සහකාර ලේකම් (පාලන)

සකස් කළේ : ..................

පරීක්ෂා කළේ: ..................

එල්. සුරේකා එච්. හේවගේ
විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

අත්සන ..................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

ඩී. නන්දනී සමරවික්‍රම

නම: ..................

තනතුර : ..................

දිනය: 2019.02.27

නිල මුද්‍රාව: ..................